# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2009 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය අයත් අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා අංක 02හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු 02ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත දක්වන කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ.

1.1 ලිඛිත විභාගය

| *තනතුර* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| අලෙවි සහකාර | බුද්ධි පරීක්ෂණය | 100 | 40 |
| | සාමාන්‍ය දැනීම | 100 | 40 |

02. *අවශ්‍ය සුදුසුකම් :*

2.1 විවෘත බඳවා ගැනීම
2.2 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය
2.3 අධ්‍යාපන සුදුසුකම් : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම; හා
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම
2.4 කායික සුදුසුකම් :
දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා කායික හා මානසික ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
2.5 *වෙනත් :*
ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
තනතුරට අදාළව *ගැසට් පත්‍රයේ*/පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

03. *වයස :*
3.1 අවම සීමාව : අවුරුදු 18
3.2 උපරිම සීමාව : අවුරුදු 30

04. *තනතුරේ ස්වභාවය :*
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

05. *වැටුප් :*
5.1 වැටුප් කේත අංකය : MN1-2016
5.2 වැටුප් පරිමාණය : රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

06. පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

07. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

09. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*
(i) අයදුම්පත් 2017.04.03 දිනට හෝ එදිනට ප්‍රථම රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.
(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.
(iv) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

2017 පෙබරවාරි මස 06 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
අංක 163, කිරුළපන මාවත,
කොළඹ 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා යි.)

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය අයත් අලෙවි සහකාර (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා බඳවා ගැනීම

1.0 මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 පෞද්ගලික තොරතුරු : :—————.
2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්
උදහරණ : SILVA A. B.
2.2 සම්පූර්ණ නම : ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :—————.
2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :—————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.
2.5 ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.6 විවාහ/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.8 ජාතික හැඳුනුම්පත් අංකයː

2.9 උපන් දිනය :
වර්ෂයː මාසයː දිනයː

2.10 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවු.ː මාසː දිනː

2.11 දුරකථන අංකය (තිබේ නම්) :

3.0 අධ්‍යාපන සුදුසුකම් අ. පො. ස. (සා. පෙළ)

වර්ෂය :—————. විභාග අංකය :————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙළ)

වර්ෂය :—————. විභාග අංකය :————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

4.0 අයදුම්කරුගේ සහතිකය :
ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

5.0 අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/ මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ..................... දින මා ඉදිරියේදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
අත්සන සහතික කරන ලද
නිලධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

(අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 22,935 ක් හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.)

03-107

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මාර්තු මස 24 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 මාර්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය)

01. **තනතුර** : (අධ්‍යක්ෂ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන) - තනතුරු 01

*බාහිර අයදුම්කරුවන් සඳහා :*

01. වයස් සීමාව : අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් තිබීම.

(ආ) පළපුරුද්ද
රාජ්‍ය සේවයේ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15 ක සමාජ වැඩ පර්යේෂණ කළමනාකරණය අංශයන්හි පළපුරුද්ද තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ පර්යේෂණ කළමනාකරණ සේවා ගණයේ 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ පරිපාලන පළපුරුද්ද | ලකුණු 30 |
| අදළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය : HM 1-3-2016 - රු. 86,865 - 15x2,270 = රු.120,915 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
HM 1-3-2006 - 41,745 - 15x1,110 = රු. 58,245 (මාසිකව) මූලික වැටුප - 2017 - රු. 59,793.

02. **තනතුර** : පුහුණු නිළධාරි II - තනතුරු 02

01. වයස් සීමාව : අවු. 22ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, රජයේ සේවයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ මෙම ආයතනයේ නියුතුවූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම්

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධිය;

*හෝ*

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමග පශ්චාත් උපාධියක්;

*සහ*

(ඇ) සමාජ සංවර්ධන හා සුභසාධනය පිළිබඳ රජයේ උසස් අධ්‍යාපන / පුහුණු ආයතනයක පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම පුහුණු කිරීම හා ඇගයීම සම්බන්ධව අවම වශයෙන් වර්ෂයකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය : AR 1-2016 - රු. 51,285 - 5x1,135 - 5x1,335 - 15x1,590 = රු. 87,485 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
AR 1-2006A - රු. 24,725 - 5x550-5 x 645- 15x770 - රු.42,250 (මාසිකව) මූලික වැටුප 2017 - රු. 35,349.

03. **තනතුර** : පර්යේෂණ නිළධාරි II - තනතුරු 01

01. වයස් සීමාව : අවු. 22ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු වූවන්ට හෝ මෙම ආයතනයේ නියුතුවූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත පර්යේෂණ නිබන්ධනයක් සහිත උපාධිය;

*හෝ*

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමඟ පශ්චාත් උපාධියක්;

*හෝ*

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් උපාධියක් සමඟ රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පර්යේෂණ සහකාරවරයෙකු ලෙස පර්යේෂණ කටයුතුවල වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදල අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය : AR 1-2016 - රු. 51,285 - 5x1,135 - 5x1,335 - 15x1,590 = රු.87,485 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
AR -1-2006A - රු.24,725 - 5x550-5 x 645- 15x770 -රු.42,250 (මාසිකව) මූලික වැටුප 2017 - රු. 35,349.

04. **තනතුර** : **පර්යේෂණ සහකාර III - තනතුරු 01**

01. වයස් සීමාව : අවු. 22 නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :
*බාහිර අයදුම්කරුවන්* :-

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පර්යේෂණ විෂයයන් ඇතුළත් සමාජීය විද්‍යාවන්ගෙන් ලබා ගත් උපාධිය;

*සහ*

(ආ) රජයේ හෝ පිළිගත් ආයතනයක පර්යේෂණ කටයුතු පිළිබඳව අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්ද.

*අභ්‍යන්තර අයදුම්කරුවන්* :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් පර්යේෂණ විෂයයන් ඇතුළත් සමාජීය විද්‍යාවන්ගෙන් ලබා ගත් උපාධිය;

*සහ*

(ආ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කළමනාකරණ සහකාර තනතුරක අවුරුදු 05 ක පළපුරුද්දක්.

03. වැටුප් පරිමාණය : (මාසිකව) MA 3- 1-2016 - රු.32,200 - 10x445 - 11x660- 10x730 - 5x750 = රු. 54,960 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
MA 3-2006A - රු.15,600 - 10x215-4 x 240- 15x320 -7x360- රු. 26,030 (මාසිකව) මූලික වැටුප 2017 - රු. 22,240.

05. **තනතුර** : **භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) III - තනතුරු 01**

01. වයස් සීමාව : අවු. 22ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් සහ අ. පො. ස. උසස්පෙළ සිංහල හා ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීම සහ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්ථනය පිළිබඳ නිපුනතාවය;

සහ

(ආ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයක සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02ක පළපුරුද්ද.

03. සම්මුඛ පරීක්ෂණ සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| තනතුරට අදළ විෂයානුබද්ධ පළපුරුද්ද | ලකුණු 30 |
| තනතුරට අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් දක්ෂතා හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ කුසලතාවය | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය : MA 4-2016 - 37,970-10x755 - 15x930 - 5x1,135 = රු.65,145 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
MA 4-2006A - රු. 18,230 - 10x365-15 x 450- 5x550 - රු.31,380 (මාසිකව) මූලික වැටුප 2017 - රු.26,126.

06. **තනතුර : ශ්‍රව්‍යදෘශ්‍ය කාර්මික III - තනතුරු 01**

01. වයස් සීමාව : අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම්

(අ) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක්වරකදී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධක මට්ටම ලබා තිබීම.

03. තාක්ෂණික නිපුනතා/ප්‍රවීණතා : එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදළව තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහ (05) මට්ටමට අඩු නොවන්නාවූ ශ්‍රව්‍යදෘශ්‍ය කාර්මික තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික ලබා තිබීම.

04. වැටුප් පරිමාණය : MA 2-2-2016 - රු.30,310-10x300 - 7x350 - 4x600-20x710 = රු.52,360 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.
MA 2-2-2006A - රු.14,610 - 10x145-7 x 170- 4x290 -20x345- රු.25,310 (මාසිකව) මූලික වැටුප 2017 - රු.20,890.

07. **තනතුර** : **නේවාසිකාගාර පාලක III - තනතුරු 01**

01. වයස් සීමාව : අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා

(අ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම හා සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය විෂයන්ට අදල වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් ලබා තිබීම.

*අභ්‍යන්තර අයදුම්කරුවන්*

01. සුදුසුකම් :

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ආ, ඇ, ඉ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම්කළ හැකිය.

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය එක් වරකදී පළමු භාෂාව සහ ගණිතය යන විෂයයන් දෙකට සම්මාන සහිතව විෂයයන් හයකට (06) නොඅඩුව සමත්ව තිබීම හා සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය විෂයන්ට අදල වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් ලබා තිබීම.
(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදළ අවස්ථාවන්හිදී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක).

(ඈ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

02. වැටුප් පරිමාණය : MA 1-2-2016 - රු.27,910-10x300 - 7x350 - 12x600-12x710 = රු.49,080 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි ) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ. MA 1-2-2006A - රු.13,450 - 10x145-7 x 170- 12x290 -12x345-රු.23,710 (මාසිකව) මූලික වැටුප 2017 - රු.19,234.

සියලුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

1. තනතුර ස්ථිරය.
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

සටහන : මෙම තනතුරු පුරප්පාඩුව පවතින්නේ ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අයදුම්කරුවන් පහත සඳහන් ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයේ සේවය කල යුතුය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

බඳවාගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහලම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරාගැනීම සිදුකෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2017.03.31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

ආචාර්ය රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2017 පෙබරවාරි මස 16 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488ඒ. නාවල පාර,
රාජගිරිය.

03-183

---

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව් නිලධාරින් සහ නිලධාරිණියන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාව් නිලධාරින් සහ නිලධාරිණියන් පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් ඇති පිරිමි/ ගැහැණු අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අ. අංශය - වෛද්‍ය/ දන්ත වෛද්‍ය (නිත්‍ය නාවික හමුදාව)

(1) නිලය - වැඩ බලන උප ලුතිනන් (කාන්තා/ පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - MBBS තෙවන විභාගයෙන් I වන කොටස සහ II වන කොටස සම්පූර්ණ කර තිබීම (අවසන් වසර අධ්‍යාපනය ලැබීම) /දන්තවෛද්‍ය උපාධි පාඨමාලාවේ BDS අවසන් වසර I වන කොටස සම්පූර්ණ කර තිබීම.
වයස - අවුරුදු 18 ත් 26 ත් අතර විය යුතු ය.

(2) නිලය - උප ලුතිනන් (කාන්තා/ පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - MBBS අවසාන වසර සම්පූර්ණ කර තිබීම / BDS අවසන් වසර II වන කොටස සම්පූර්ණ කර තිබීම
වයස - අවුරුදු 30 ට අඩු විය යුතු ය.

(3) නිලය - වෛද්‍ය ලුතිනන් (කාන්තා/ පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - වෛද්‍ය/ දන්ත වෛද්‍ය උපාධිය (MBBS/ BDS) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම.
වයස - පිරිමි - අවුරුදු 35 ට අඩු විය යුතු ය.
- ගැහැණු - අවුරුදු 34 ට අඩු විය යුතු ය.

ආ. අංශය - වාදක අංශය (නිත්‍ය නාවික හමුදාව)
නිලය - වැඩ බලන උප ලුතිනන් (කාන්තා/පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා සෞන්දර්ය කළා විශ්ව විද්‍යාලයේ නර්තනය පිළිබඳව ප්‍රසාංගික කළාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම; හෝ
ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක නර්තනය පිළිබඳ ලලිත කලාවේදී උපාධියක් ලබා තිබීම.
(බාත්ඛණ්ඩ විශ්ව විද්‍යාලයේ නර්තන විශාරද ඩිප්ලෝමාවක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ)
වයස - අවුරුදු 30 ට අඩු විය යුතු ය.

ඇ. අංශය - නැව්බඳ ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)
නිලය - ලුතිනන් (පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - යාන්ත්‍රික/ නිෂ්පාදන/ ද්‍රව්‍ය විද්‍යාව යන විෂයයන්වලට අදාලව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් ලබා තිබීම;
හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් පිළිගන්නා (AMIE Sri Lanka) සුදුසුකම් සපුරා තිබීම.
වයස - වයස අවුරුදු 32 ට අඩු විය යුතු ය.

3. අනෙකුත් සුදුසුකම් .- අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතු ය.

(අ) පුරවැසිභාවය - ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) වයස - 2017 මාර්තු මස 31 දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතුය.

(ඇ) උස - පිරිමි - සෙමී 168 ට නොඅඩු විය යුතු ය.
කාන්තා - සෙමී 160 ට නොඅඩු විය යුතු ය.

(ඈ) බර - පිරිමි - කිග්‍රෑ 52 ට නොඅඩු විය යුතු ය.
කාන්තා - කිග්‍රෑ 41 ට නොඅඩු විය යුතු ය.

(ඉ) පපුව - පිරිමි සෙමී 81 ට නොඅඩු විය යුතු ය.

(ඊ) වර්ණ දෘෂ්ඨිය - එස්ටීඩී II. (නිසි පෙනුම)

(උ) දෘෂ්ඨි තීක්ෂණත්වය - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6
* වෛද්‍ය/දන්ත නිළධාරින් සහ සිසුන් සඳහා දුර දර්ශණය උපැස් රහිතව 6/6 සිට 6/12 දක්වා (උපැස් මගින් 6/6 ලෙස නිවැරදි කර තිබීම)

(ඌ) සිවිල් තත්වය - පිරිමි - අවිවාහක
කාන්තා - අවිවාහක

■ වෛද්‍ය සහ දන්ත වෛද්‍ය අංශයෙහි ලුතිනන් (පිරිමි/ ගැහැණු) - විවාහක / අවිවාහක

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. ගැසට් පත්‍රයේ ඉල්ලා ඇති මිම් වලට අනුව උස,වයස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි:*

*අ.* අපේක්ෂකයින් නිත්‍ය නාවික හමුදාවේ නිලධාරි/ නිලධාරිණි තනතුරු සඳහා බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. පාඨමාලාවේ කාලය බඳවාගනු ලබන ඒ ඒ අධිකාරිය අනුව වෙනස් වේ.

*ආ.* ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුවක් ලැබීම සඳහා බඳවාගනු ලබන නිත්‍ය නිලධාරින්/ නිලධාරිණියන් සූදානමින් සිටිය යුතුයි.

*ඇ.* සියලු නිලධාරින්/ නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

*ඈ.* පුහුණුව ලබන කාලසීමාව තුළදී හා ඉන් පසුව නිත්‍ය නිලධාරින්/ නිලධාරිණියන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

*ඉ.* අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළදී යම් නිත්‍ය නිලධාරියකු/ නිලධාරිණියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය විසින් එම නිත්‍ය නිලධාරියා/ නිලධාරිණිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලු වියදම් එම නිත්‍ය නිලධාරියා/ නිලධාරිණිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

*ඊ.* පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි නිත්‍ය නිලධාරියකු/ නිලධාරිණියක නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදාළ නිත්‍ය නිලධාරියා/ නිලධාරිණිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලු වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමඟ ගිවිසුමකට හෝ බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

*උ.* පුහුණුව ලබන කාලසීමාව තුළ නිත්‍ය නිලධාරින්/ නිලධාරිණියන් හට නිලධාරි නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

*ඌ.* විවාහක නිලධාරින්/ නිලධාරිනියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා :* තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. වැටුප් හා දීමනා :

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| *විස්තරය* | *වැඩ බලන උප ලුතිනන්* | *උප ලුතිනන්* | *ලුතිනන්* |
|---|---|---|---|
| මූලික වැටුප | 28,897.00 | 32,807.00 | 38,333.00 |
| ජීවන වියදම් දීමනාව | 7,800.00 | 7,800.00 | 7,800.00 |
| නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | 255.00 | 255.00 | 255.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.00 | 600.00 | 600.00 |
| දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| ගැලපුම් දීමනාව | 5,373.00 | 4,715.00 | 3,833.00 |
| ආහාර දීමනාව | 16,138.00 | 16,138.00 | 16,138.00 |
| එකතුව | 63,063.00 | 66,315.00 | 70,959.00 |

(අ) ගැලපුම් දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව 2020.01.01 දිනට සම්පූර්ණ වශයෙන් මූලික වැටුපට එකතු වේ.

(ආ) ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරින්/නිලධාරිනියන් සඳහා පමණක් හිමිවේ.

(ඇ) සුදුසුකම් වේතනය අදාළ පරිදි මසකට උපරිම රු.637.50 ක් ගෙවනු ලැබේ.

(ඈ) නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(ඉ) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු හිමිවේ.

(ඊ) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

(උ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිණියට කලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට)

(ඌ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට/ නිලධාරිණියට රු.1,600.00 සිට රු.4,250.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමි වේ.

(එ) වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරින් සහ නිලධාරිණියන් හට සෞඛ්‍යය අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි සීමාවාසික පුහුණුවෙන් පසු අමතර රාජකාරී දීමනාව සහ 1/20 දීමනාවන් සඳහා හිමිකම් ඇත.

(ඒ) ඉංජිනේරු නිලධාරින් සඳහා රජයේ අනුමත විශේෂ දීමනාවන් සඳහා හිමිකම පවතී.

9. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලු ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2017 මාර්තු මස 31 දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්) , නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙළවරේ "ඉඳුරාම බඳවා ගැනීම - නිත්‍ය නිලධාරීන්/ නිලධාරිණියන්"යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215154/ 011-2215512/ 011-2215513 මගින් ලබා ගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කල යුතු අතර ඉල්ලුම්පත් යොමු කිරීමේදී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය.
(2) අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/ උසස් අධ්‍යාපන/ වෘත්තීය අධ්‍යාපන/ උපාධි සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය/ චරිත සහතිකය.
(4) මාස 06ක් ඇතුලත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පලපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික
(6) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය.)
(7) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.
(ඉ) කිසිම වෙනත් ලියකියවිලි හෝ ලේඛන වල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.
(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

11. තෝරා ගැනීමේ/සම්මුඛ පරීක්ෂණ ආදිය :

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයඳුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වීම සඳහා අවශ්‍යතා

| වයස් කාණ්ඩය | මීටර් 800 දුර දිවීම | CURL UP (2MN) | PUSH UP (2MN) |
|---|---|---|---|
| 18 - 24 පිරිමි | මිනිත්තු 3.30 - 5.30 අතර | 19 හෝ ඊට වැඩි | 21 හෝ ඊට වැඩි |
| 18 - 24 කාන්තා | මිනිත්තු 4 - 6 අතර | 13 හෝ ඊට වැඩි | 05 හෝ ඊට වැඩි |
| 25 - 29 පිරිමි | මිනිත්තු 4 - 5.30 අතර | 19 හෝ ඊට වැඩි | 20 හෝ ඊට වැඩි |
| 25 - 29 කාන්තා | මිනිත්තු 4.30 - 6.30 අතර | 12 හෝ ඊට වැඩි | 03 හෝ ඊට වැඩි |
| 30 - 34 පිරිමි | මිනිත්තු 4.30 - 6.30 අතර | 15 හෝ ඊට වැඩි | 14 හෝ ඊට වැඩි |
| 30 - 34 කාන්තා | මිනිත්තු 5 - 7 අතර | 09 හෝ ඊට වැඩි | 02 හෝ ඊට වැඩි |
| 35 - 39 පිරිමි | මිනිත්තු 5 - 7 අතර | 13 හෝ ඊට වැඩි | 12 හෝ ඊට වැඩි |

(ඇ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයඳුම්කරුවන් පමණක් එදිනම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එයින් සමත් වන අයඳුම්කරුවන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයඳුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අතර එම පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයඳුම්කරුවන් පමණක් බඳවාගනු ලැබේ.
(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැණුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.
(ඉ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුණුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කල යුතුය.
(ඊ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.
(උ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කල යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.
(ඌ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.
(එ) වෛද්‍ය / දන්ත වෛද්‍ය අංශය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් දැනට විශ්ව විද්‍යාලය අධ්‍යාපනය හදාරමින් සිටින අවස්ථාවක දී ඔහු හෝ ඇය තෝරාගැනීමෙන් පසු නැවත විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා පූර්ණ වැටුප් සහිතව මුදාහරින අතර මෙහිදී ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට එළඹිය යුතුය.

*සටහන.*- මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ආර්සී විජේගුණරත්න, ඩබ්වී, ආර්ඩබ්පී*, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්එන්,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුදා මූලස්ථානය,
තැපෙ 593,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ නිළධාරින්/නිළධාරිනීන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————————————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද , ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන්නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)
2. ඉල්ලුම් කරන අංශය සහ තනතුර :————————————.
3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව):————————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය:————————————.
5. ස්ථිර ලිපිනය:————————————.
6. තැපැල් ලිපිනය:————————————.
7. විද්‍යුත් ලිපිනය:————————————.
8. උපන් දිනය:————————————.
9. වයස: අවුරුදු ....... මාස ....... දින ....... (2017 මාර්තු මස 31 දිනට)
10. උස ............(සෙ.මී) පපුව ........(සෙ.මී) බර ........(කි.ග්‍රෑ)
11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය:————————————.
12. දිස්ත්‍රික්කය:————————————.
13. ඡන්ද කොට්ඨාසය:————————————.
14. ග්‍රාම නිළධාරි කොට්ඨාසය:————————————.
15. දුරකථන අංකය:————————————.
16. විවාහක හෝ අවිවාහක බව:————————————.
17. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.
18. අධ්‍යාපනය ලැබූ පාසල:————————————.
19. පාසල සහ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර:————————————.

| පාසලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස . (සා.පෙළ):<br>අ.පො.ස . (උ.පෙළ):<br>වෙනත්: | | |

20. පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|---|
| පියා | | | | |
| මව | | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම් , දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

24. පාසලේදී , විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න)

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ කර ඇති සේවය :————.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිඳුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත් හිට වූ සිර දඬුවමක් ලබා තිබේ ද? එසේනම් විස්තර සඳහන් කරන්න :————.

28. රජයේ දෙපාර්තමේන්තුවකදී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව , ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

29. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

30. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :
පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාල වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

03-276

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2017

**2017/2019 අධ්‍යයන වර්ෂය සඳහා සත්ත්ව පාලන දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව**

***අයදුම්පත් භාරගන්නා අවසන් දිනය දීර්ඝ කිරීම***

2017. 02.03 වැනි දින අංක 2005 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට සිසුන් ඇතුළත්කර ගැනීම සඳහා පැවැත්වෙන තරග විභාගයට (2017 වර්ෂයට අදාළව) අයදුම්පත් කැඳවා ඇත. එම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2017.03.10 දින දක්වා දීර්ඝ කරන බව දන්වමි.

වෛද්‍ය ආර්. පී. එම්. පතිරත්න,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රා. ආ.).

03-72

---

**ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

ග්‍රාම නිලධාරී පාලන අංශය

**ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017**

1.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත බඳවාගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් 2017 ජුනි මාසයේ දී පවත්වනු ලබන බවත්, ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 ග්‍රාම නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය පැවැත්වෙන නගර හා නගර අංක පහත වගුවේ දැක්වේ. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතුවේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| මාතර | 04 |
| යාපනය | 05 |
| මන්නාරම | 06 |
| මුලතිව් | 07 |
| ත්‍රිකුණාමලය | 08 |
| මඩකලපුව | 09 |
| කුරුණෑගල | 10 |
| අනුරාධපුර | 11 |
| බදුල්ල | 12 |
| රත්නපුර | 13 |
| කිලිනොච්චිය | 14 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති, උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්.*—2010.09.29 දින සිට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය අනුව, ග්‍රාම නිලධාරී සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් මෙම විභාගය සඳහා ඉදිරිපත්වීමට සුදුසුකම් ලබයි.

5.0 *විභාග පටිපාටිය.*—අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. :—

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය | 100 | පැය 01 1/2 | 1 |
| 2. | විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම | 100 | පැය 01 1/2 | 2 |

5.1 **කාර්යාල ක්‍රම, රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය**

කාර්යාල ක්‍රම :
රජයේ කාර්යාලවල හා ග්‍රාම නිලධාරි කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.

*රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය :*
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති අනුව විනය බලතල බෙදී ඇති ආකාරය, සේවය අවසන් කිරීම, විශ්‍රාම ගැන්වීමට අදාළ රීති හා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සාමාන්‍ය හැසිරීම හා විනය ක්‍රියා පටිපාටියට අදාළ XLVII හා XLVIII පරිච්ඡේදයන්හි සඳහන් විධිවිධාන හා ඒ සම්බන්ධව තත්කාලීනව නිකුත් කර ඇති චක්‍රලේඛ පිළිබඳ ඇති දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කෙරේ.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වේ.

I *වැනි කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි);

II *වැනි කොටස* - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01යි (ලකුණු 75 යි.)

5.2 **විෂයානුබද්ධ අධ්‍යයනය හා වෘත්තීය දැනුම :**
ග්‍රාම නිලධාරීන්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් ව්‍යවස්ථාපිත රජයේ ආයතන මගින් පැවරී ඇති රාජකාරි පිළිබඳ දැනුම පරීක්ෂා කරන අතර එම විෂයයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යයනයෙන් සමන්විත වේ :-

I *වැනි කොටස* - බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. කාලය මිනිත්තු 30යි. (ලකුණු 25යි)

II *වැනි කොටස* - ප්‍රශ්න තුනකින් සමන්විත අර්ධ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි. (ලකුණු 75 යි.)

6.0 සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර, අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.0 තමන් කැමතිනම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලුම විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

8.0 විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

9.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් තම සේවා වසමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා මගින් 2017 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'විභාගයේ නම' සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසා ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තම අත්සන සහතික කරවාගත් විභාග ප්‍රවේශ පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අනන්‍යතාව විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11.0 *අයදුම්පත්‍ර.*—ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 6.0 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ද, 7.0 ශීර්ෂයේ සිට දෙවන පිටුවටද ඇතුළත් වන පරිදි ''ඒ4'' ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙළ කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම් පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

